


කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන

චිත්‍ර: ට්‍රිෂාන් ප්‍රනාන්දුපුල්ලේ

# ව්‍යාජ පුවත්

## හැඳින්වීම

ඩිජිටල් පද්ධති පිළිබඳ ඔබේ දැනුම හෙවත් ඩිජිටල් සාක්ෂරතාවයේ වැදගත්ම අංගයක් වන්නේ දත්ත සොයාගැනීම පමණක් නොව එම දත්තවල නිවැරදි බව ද පරීක්ෂා කිරීම යි. ඒ සඳහා ඔබ තොරතුරු ලබා ගත් මූලාශ්‍රය / ස්ථානය විශ්වාසකටයුතු එකක් ද යන්න පරීක්ෂා කළ යුතුය.

ව්‍යාජ පුවත් යනු වර්තමානයේ ජනප්‍රිය වදනක් වුවත්, එහි සත්‍ය - අසත්‍යතාව  තහවුරු කරගැනීම අපහසුය. මන්ද එය විවිධ ආකාර විය බැවිනි:

- අසත්‍ය තොරතුරු (සිතාමතා ප්‍රචාරය කරන ව්‍යාජ තොරතුරු)
- වැරදි තොරතුරු (නොදැනුවත්ව ප්‍රචාරය කරන අසත්‍යයන්)
- අනිෂ්ට තොරතුරු (සමාජයට හානියක් කිරීමේ අරමුණින් පතුරන ව්‍යාජයන්)

ව්‍යාජ තොරතුරු සහ ඡායාරූප කාලාන්තරයක් තිස්සේ පැවතගෙන එන්නකි. කෙසේ වෙතත් 21 වන සියවසේ දී අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය භාවිත කොට ගෙන මෙවැනි දෑ ප්‍රචාරණය කිරීම පහසු වී ඇත. මේවා නිසා විශාල හානි සිදුවිය හැක: මෙයින් සමාජයට බලපෑම් ඇති විය හැක, ආගමික හෝ වාර්ගික කණ්ඩායම් අතර වරදවා වටහාගැනීම් හා ආරවුල් ඇති විය හැක, මැතිවරණවල දී ඡන්දදායකයින්ව ව්‍යාකූල කළ හැක, ප්‍රචණ්ඩත්වයට දිරි දීම මගින් සාමකාමී සමාජයකට තර්ජනයක් එල්ල කිරීමට පවා ඉඩ ඇත.


ම්... ලබු කිරිබත් හරි සුවඳයි.
රස ඇති.
මේක නම් බෙදා ගන්න බෑ


හා හාමී ලබු කිරිබත් නැට්ට නැති කැන්ද කොළේ කැවම රස වැඩිලු.
කොළ ටිකක් හොයන් එනවද?
හිහ් හිහ් හිහ් !!!
කොහෙද මේ නැට්ට නැති කොල?
කැන්ද!
අයියෝ... නැට්ට තියනවනේ..
ම්...
මෙහෙ නෑ. මට බඩගිනී දැන්.



බර්ප...
මොකක්ද
!*#@#$%!*#$!!
!*#@#$%!*#$!!
මට නැගිටින්න උදව් කරන්න
POST
හාවා තරියාට පහර
තරියාට අසාද්‍යයි.


පෝස්ට් එක වයිරල් ගියා.
හාවා නරියාට පහර දෙයි. නරියාට අසාද්‍යයි. #JusticeForFox
Share
හාවාට මේකෙන් බේරෙන්න දෙන්න බෑ..
මේක වැරදි වැඩක්.
මේ... මේක කියෙව්ව ද?
හාවා නරියාට පහර දෙයි?
මට ඇහුනා නරිය ICU එකේලු.
ඇත්තද?
මාධ්‍ය සාකච්ඡ


නරියගේ අයිතීන් රකිමු.
අපි නරියාට
නරියාට යුක්තිය!
නීතිය නිදිද?
මෙයාල ඉස්සෙල්ලාම වතාවට මගේ පැත්තෙ.
මට යුක්තිය!


අත්අඩංගුවට ගමු.
මං මුකුත් කලේ නෑ
හුරේ!!!
අහිංසක හාවා අසත්‍ය තොරතුරු නිසා අමාරුවේ වැටුනා.
ඔබ share කරන තොරතුරු අසත්‍ය විය හැකිය. වැරදි තොරතුරු ප්‍රචාරය කෙනෙකුට හානිකර විය හැක.

# උගත් පාඩම්

## ව්‍යාජ පුවත් හඳුනාගැනීම සඳහා උපදෙස්

- අර්ථයක් නැති පුවත් පිළිබඳව අවධානයෙන් සිටින්න.
- අදාළ පුවත ප්‍රකාශයට පත්කළ වෙබ් අඩවියේ කුමක්දැයි පරීක්ෂා කරන්න.
- ව්‍යාජ වෙබ් අඩවි ලිපින ගැන අවධානයෙන් සිටින්න.
- ප්‍රවෘත්තියට නොගැලපෙන සිරස්තල පිළිබඳව අවධානය යොමු කරන්න.
- අසාමාන්‍ය වැරදි සහ අක්ෂර වින්‍යාසයන්ට අවධානය යොමු කරන්න.
- මිනිසුන් කෝපයට පත් කිරීමට, ඇවිස්සීමට උත්සාහ දරන සිරස්තල ගැන සැලකිලිමත් වන්න.
- ජනප්‍රිය පුද්ගලයින්ගේ නම්වලින් ඇති ව්‍යාජ ගිණුම් මගින් පතුරුවා ඇති ව්‍යාජ තොරතුරු පිළිබඳව සොයා බලන්න.
- ඡායාරූප වේ නම්, ඒවා Googleහි සර්ච් කර බලන්න.
- ඔබට යමක් අවිශ්වාස කටයුතු නම්, ඔබට විශ්වාසී අයෙකු ට යවා නැවත වරක් පරීක්ෂා කරන්න.